සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

21 S I

# පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
# First Term Test, March 2019

**11 ශ්‍රේණිය**
Grade 11

## ඉස්ලාම් ධර්මය - I

**පැය එකයි**
One hour

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ඉතා සුදුසු හා නිවැරදි පිළිතුර තෝරන්න.

01. සකාත් අනිවාර්ය කරන ලද හිජ්රි වසර,
    (1) හිජ්රි 1 (2) හිජ්රි 2 (3) හිජ්රි 3 (4) හිජ්රි 4

02. 'ඉවසීමේ මාසය' යනුවෙන් හැඳින්වන මාසය,
    (1) මුහර්රම් (2) දුල් - හජ් (3) රමළාන් (4) ෂව්වාල්

03. කුරුස යුද්ධ සිදු වූ කාල වකවානුව,
    (1) ක්‍රි.ව. 1088 - ක්‍රි.ව. 1290 (2) ක්‍රි.ව. 1500 - ක්‍රි.ව. 1610
    (3) ක්‍රි.ව. 850 - ක්‍රි.ව. 1000 (4) ක්‍රි.ව. 1200 - ක්‍රි.ව. 1300

04. අල්ලාහ්ගේ ස්නේහවන්තයින් විසින් ඉදිරිපත් කෙරෙන ප්‍රාතිහාර්යයන්,
    (1) කරාමත් වේ. (2) මුඃජිසාත් වේ. (3) හිකායත් වේ. (4) රිසාලත් වේ.

05. ඉස්මත් යනු,
    (1) නබිවරු ඉදිරිපත් කරන හාස්කම්
    (2) නබිවරුන්ට ස්වර්ගය වාජිබ්වීම.
    (3) නබිවරු මහා පාප කර්මවලින් ආරක්ෂා වී සිටීම.
    (4) නබිවරු සියලුදෙනාම රසූල්වරුන් වීම.

06. අල්කුර්ආනය ගොනුකිරීමේ කාර්යයට නායකත්වය දැරුවේ,
    (1) අලි (රලි) (2) අබූ බක්ර් (රලි)
    (3) උමර් (රලි) (4) සෙය්ද් බින් සාබිත් (රලි)

07. මිනිසෙකු මෙලොවෙහි නොකළ යුතු කාර්ය,
    (1) ජිනායාත් (2) ඉබාදත් (3) කිලාෆත් (4) ඉමාරත්

08. 'වසරක් සම්පූර්ණ වී තිබීම' යන කොන්දේසිය රහිතව සකාත් විධිමත්වන භාණ්ඩය,
    (1) තිරිඟු (2) එළුවන්
    (3) වෙළඳ භාණ්ඩ (4) රත්‍රන්

09. එළුවන් 120 ක අයිතිකරුවෙක් වසර අවසානයේ ගෙවිය යුතු සzකාත් ප්‍රමාණය,

(1) එළු දෙණුන් 2 ක්. (2) එළු දෙණුන් 3 ක්.
(3) එළුදෙනෙක් (4) එළු දෙණුන් 4 ක්.

10. අසංක යන තරුණයා 'මෙලොව කිසිවෙකුගේ මැවුමක් නොව, ස්වභාවිකව බිහිවූවකි.' යනුවෙන් තර්ක කරයි. ඔහු අයත් වන ගණය,

(1) මුෂ්රික් (2) මුනාෆික් (3) කාෆිර් (4) මුල්හිද්

11. උපවාස රැකීමට සුන්නත් වූ අයියාමුල් බීල් දිනයන් වන්නේ,

(1) ෂව්වාල් මසෙහි දින 6 (2) සෑම මසකම 13, 14, 15 දිනයන්
(3) සෑම මසකම 27,28,29 (4) මුහර්රම් 9,10

12. ඉද්රීස් (අලෛ) හට ප්‍රදානය කරන ලද සුහුෆ් සංඛ්‍යාව,

(1) 10 (2) 50 (3) 30 (4) 20

13. රමළාන් අවසාන දින දහයේ ඉටු කරන විශේෂ යහක්‍රියාව,

(1) කුර්ආන් පාරායනා කිරීම. (2) රාත්‍රී නැමදුම
(3) සදකා දීම (4) ඉඃතිකාෆ් රැඳීම.

14. තව්හීදය තහවුරු කරන සූරාව,

(1) සූරා අසර් (2) සූරා ෆාතිහා (3) සූරා ඉඛ්ලාස් (4) සූරා නාස්

15. පහත සඳහන් වගන්ති අතරින් ෂරීආ සම්බන්ධ නිවැරදි මතය වන්නේ,

(1) සියලු නබිවරු දේශනා කළේ එකම ෂරීආවයි.
(2) ෂරීආවන් කාලය, පසුබිම අනුව යුගයෙන් යුගයට වෙනස් විය.
(3) ෂරීආවක් අනුගමනය කිරීමට අවශ්‍ය නැත.
(4) ෂරීආ තුළ විවිධ අදහස් නැත.

16. හජ් කරන බැතිමතා සුවඳ විලවුන් තැවරීම,

(1) හරාම් (2) හලාල් (3) වාජිබ් (4) මක්රූහ්

17. රත්‍රන් සඳහා වූ නිසාබ් ප්‍රමාණය,

(1) 85 g (2) 80 g (3) පවුම් 85 කි. (4) පවුම් 8 කි.

18. හජ් බැතිමතුන් දුල්-හජ් 9 යෙහි අනිවාර්යයෙන් රැඳිය යුත්තේ,

(1) මිනාවෙහිය. (2) අරෆා පිටියෙහි ය.
(3) මස්ජිදුල් හරාම්හි ය. (4) මස්ජිදුන් නබවියෙහි ය.

19. මස්ජිදුල් අක්සාව පෙරටුකර මුහුණ ලා නබිතුමා සලාත් ඉටුකළ කාල සීමාව,

(1) මාස 12 කි. (2) මාස 13 කි. (3) මාස 15 කි. (4) මාස 16 කි.

20. බනූ හාෂිම්, බනූ-මුත්තලිබ් යන්නන්,

(1) නබිතුමාගේ පෙළපතට අයත් වන්නන් ය.
(2) ජාහිලියියා යුගයේ වෙසුනු යහ ගැත්තන් ය.
(3) අබ්බාසියියාවරුන් ය.
(4) මදීනාවේ වෙසුනු ගෝත්‍රිකයන් ය.

21. සකාත් නොගෙවන්නන්ට අල්ලාහ් පරීක්ෂණයට ලක්කරන ආකාරයකි,

(1) දුගීභාවයෙන් පෙළීම මගින් (2) ගින්දර මගින්

(3) ධනය මගින් (4) විනාශය මගින්.

22. පහත සඳහන් අංගයන්ගෙන් 'බයිතුල් මාල්' හා බැඳෙන ක්ෂේත්‍රය,

(1) දේශපාලන (2) අධ්‍යාපන (3) ආර්ථික (4) ක්‍රියාත්මක

23. ඊමාන්හි අති පහළම තත්වය යනුවෙන් සඳහන් වී තිබෙන්නේ,

(1) කලීමාව උච්චාරණය කිරීම. (2) අවශ්‍යතාවයන් අල්ලාහ්ගෙන් ම පැතීම.

(3) සටනෙහි සහභාගී වීම. (4) මාර්ගයෙහි හානිපමුණුව දැ ඉවත් කිරීම.

24. සලාතය කඩින් කඩ ඉටු කරන අය ලගින නිරය,

(1) ගෙ (2) ජහන්නම් (3) නාර් (4) සකර්

25 කවාරිජ් යන දාර්ශනික කණ්ඩායම බිහි වූ කාල වකවානුව,

(1) අබුබක්ර් (රළි) යුගය (2) උමර් (රළි) යුගය

(3) උස්මාන් (රළි) යුගය (4) අලි (රළි) යුගය

26. අවසන් අත්තහියියාත් හිඳුම

(1) ඉෆ්තිරාෂ් (2) තවර්රුක් (3) නද්ර් (4) ෆරාඉල්

27. දුල්හජ් 12 වන දින උපවාස රැකීම,

(1) සුන්නත් වේ. (2) වාජිබ් වේ. (3) හරාම් වේ. (4) මක්රූහ්

28. හජ් මෙහෙය ඉටුකළ යුතු කාලසීමාව,

(1) දුල්හජ් මාසය (2) දුල් හජ් 8 - 13 දිනයන්

(3) දුල්හජ් 10 -15 දිනයන්. (4) දුල් හජ් 9 - 12 දිනයන්.

29. මස්ජිදුල් අක්සාව යුදෙව්වරු ගිණිබත් කළ වසර,

(1) 1965 දී (2) 1942 දී (3) 1924 දී (4) 1967 දී

30. උපවාස රැකීම සඳහා ශක්තිමත් වීම යනු උපවාසයේ,

(1) ෆර්ල්වලින් එකකි.

(2) ෂර්ත්වලින් එකකි.

(3) මුබ්තිලාත්වලින් එකකි.

(4) වාජිබ්වලින් එකකි.

31. 'අ' හා 'ආ' යා කිරීමෙන් ලැබෙන නිවැරදි පිළිතුරු ගොනුව,

| 'අ' | | 'ආ' |
|---|---|---|
| (1) ෂිර්ක් | A | ස්වර්ගයේ දොරටුවකි. |
| (2) අස්හාබුස්සුෆ්ෆා | B | පිළේ මිතුරන්. |
| (3) රයියාන් | C | ආදේශ කිරීම. |
| (4) නිසාබ් | D | අවම ප්‍රමාණයට පත්වීම. |

(1) DBCA (2) DABC (3) CBAD (4) ABCD

32. 'අ' හා 'ආ' යා කිරීමෙන් ලැබෙන නිවැරදි පිළිතුරු ගොනුව,

| 'අ' | | 'ආ' |
|---|---|---|
| (1) අස්වතුන් අන්සි | A | ස්ත්‍රී ව්‍යාජ නබිවරියෙකි. |
| (2) මුසෙලමා | B | යෙමන් ප්‍රදේශයට අයත් වූවකි. |
| (3) සජාහ් | C | නබි තුමාගේ සමයේ ද ජීවත් විය. |
| (4) තුලෙලෙහා | D | ව්‍යාජ නබිවරයෙකුව සිට පසුව ඉස්ලාමය වැළඳගත් කෙනෙකි. |

(1) BCAD (2) CBAD (3) DABC (4) DBCA

33. පහත සඳහන් පදයන් අතරින් පරමාන්තය නොහඳුන්වන පදය,

(1) යව්මුල් කියාමා (2) යව්මුන්තනහ්ර්
(3) යව්මුද්දීන් (4) යව්මුල් ආහිරා

34. නබිතුමාගෙන් පසුව මස්ජිදුල් අක්සාවෙහි ප්‍රථම වරට සලාතය මෙහෙයවන ලද්දේ මෙතුමා විසිනි,

(1) අබූබක්ර් (රළි) (2) උමර් (රළි)
(3) සලාහුද්දීන් (4) මුහම්මද් ෆාතිහ්

35. හජ් මෙහෙවරෙහි මිනාවෙහි ඉටු කෙරෙන වතාවතය,

(1) සැහැල්ලු දිවීම. (2) තවාෆ්
(3) සඃයු (4) ෂෙයිතාන්ට ගල් විසි කිරීම.

36. කාදර් හාජිගේ බිරිඳ සතුව පවුම් 25 ක ආභරණ තිබේ. නමුත් ඇය පැළඳීම සඳහා භාවිතා කරන්නේ පවුම් 10 ක ආභරණ පමණි. ඇය වසර අවසානයේ සZකාත් ගෙවිය යුතු පවුම් ප්‍රමාණය,

(1) 10 (2) 15 (3) 20 (4) 25

37. නිදන් වශයෙන් රත්‍රන් හිමි කරගත් පුද්ගලයා, එය නිසාබ් ප්‍රමාණයට එළඹී ඇත්නම් ඔහු ගෙවිය යුතු සZකාත් ප්‍රමාණය,

(1) 5% (2) 2.5% (3) 10% (4) 20%

38. මහා ෂිර්ක් සහ කුෆ්ර් ඇති කරන ක්‍රියවන් කර, තමන් නිවැරදි බව ප්‍රකාශ කරන පුද්ගලයා,

(1) මුර්තද් වේ. (2) මුෂ්රික් වේ.
(3) කාෆිර් වේ. (4) මුනාෆික් වේ.

39. ඉබාදත් වන දෛනික කටයුතු අතරින් ෆර්ල් අයින් වන ඉබාදතයකි,

(1) රෝගීන් බැහැ දැකීම. (2) තම දරුවන් සඳහා වූ වියදම දැරීම.
(3) ඉගැන්වීම් කටයුතු කිරීම. (4) ව්‍යාපාර කිරීම.

40. මුඃතසිලා කණ්ඩායමට විරුද්ධව සටන් කළ ඉමාම්වරයා,

(1) ඉමාම් ෂාෆි (2) ඉමාම් මාලික්
(3) ඉමාම් අහ්මද් (4) ඉමාම් අබූහනීෆා

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
Department of Education, Southern Province

| 21 | S | II |
|---|---|---|

**පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු**
First Term Test, March 2019

**11 ශ්‍රේණිය**
Grade 11

**ඉස්ලාම් - II**

පැය දෙකයි
Two hours

- 1 වෙනි ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න සතරක් තෝරා, ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

(01) කෙටි පිළිතුරු සපයන්න.

(1) උපවාසයේ වැදගත්කම හුවා දක්වන හදීසයක් සඳහන් කරන්න.

(2) මස්ජිදුල් අක්සාව නැවත නිදහස් කරගත් සෙන්පති දෙදෙනෙක් නම් කරන්න.

(3) ඉබ්රාහීම් නබිතුමාගේ බිරියන් දෙදෙනා නම් කරන්න.

(4) ව්‍යාජ නබිවරු තම ප්‍රචාරය සඳහා යොදාගත් මාර්ග දෙකක් ලියන්න.

(5) සකාත්හි ෆර්ලයන් ලියන්න.

(6) කඃබාව මත ප්‍රථමයෙන් ම ප්‍රතිමාව තැබූ පුද්ගලයාව නම් කර, එම ප්‍රතිමාවේ නම ද ලියන්න.

(7) තවාහුල් ඉෆාළා, තවාහුල් විදා දෙක අතර පවතින වෙනස කුමක්ද?

(8) 'අහ්ලුස් සුන්නාහ් වල් ජමාආව ආරක්ෂා කිරීමට ඉදිරිපත් වූ අකීදා කණ්ඩායම් දෙකක් නම් කරන්න.

(9) ඉලාහියියාත් යන මාතෘකාවට අයත් වන කරුණු දෙකක් සඳහන් කරන්න.

(10) සකාත් ලැබීමට නුසුදුසු පිරිස් දෙකක් සඳහන් කරන්න. (ල. 2x10=20)

(02) (1) උපවාසධාරියෙකු අත්කරගන්නා ද්විත්ව සතුට කුමක්ද?

(2) හජ්හි සුන්නතයන් තුනක් සඳහන් කරන්න.

(3) සකාත් සමූහ වශයෙන් ඉටු කෙරෙන කල අත්කරගත හැකි යහඵල විස්තර කරන්න. (ල. 2+3+5=10)

(03) (1) මහා ෂිර්කයට උදාහරණ දෙකක් ලියා දක්වන්න.

(2) ඉස්ලාමීය දැක්මෙන් අති වැදගත් කරුණක් වන 'තව්හීදය' ප්‍රධාන අංග තුනකින් පහදන්න.

(3) 'අල්ලාහ්' හා බැඳෙන අදහස්හි අහ්ලුස්සුන්නාහ් වල් ජමාආවෙහි ස්ථාවරය පහදන්න. (ල. 2+3+5=10)

(04) (1) සකාත් අනිවාර්ය වන භාණ්ඩ සතරක් නම් කරන්න.

(2) මුහම්මද් (සල්) අවසාන වක්තෘවරයා යන්නට තාර්කික සාක්ෂි තුනක් ඉදිරිපත් කරන්න.

(3) මුර්තද්වරයා සමඟ ඉස්ලාමීය සමාජය ක්‍රියා කළයුතු ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 2+3+5=10)

(05) (1) 'නිසාබ්' යන පදයෙන් හඟවන්නේ කුමක්ද?

(2) නබිතුමාගේ සහ සහාභාවරුන්ගේ යුගවල ඉස්ලාමීය අකීදා නිසි අයුරින් පැවැතීමට හේතු තුනක් ඉදිරිපත් කරන්න.

(3) සකාත් ලබාගැනීමට සුදුසුකම් ලබන කණ්ඩායම් පහක් සඳහන් කරන්න. (ල. 2+3+5=10)

(06) (1) වාර්ෂිකව රකිනා සුන්නත් සව්ම් 4 ක් නම් කරන්න.

(2) අකීදා ක්ෂේත්‍රයට අයත් විද්වතුන් තිදෙනෙක් නම් කරන්න.

(3) නබිතුමාගේ කාලයේ මස්ජිදුන් නබවිහි ක්‍රියාකලාපයන් වත්මන් මස්ජිදයන්ට ආදර්ශමත් වන්නේ කෙසේද යන්න පහදන්න. (ල. 2+3+5=10)

(07) මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(1) කලාකද්ර් (2) ඉල්හාද්

(3) හජ් මෙහෙය ඉටුකරන ආකාරය (4) මස්ජිදුල් අක්සා (ල. 5+5=10)